**ශීර්ෂය - 235 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 25 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ලැබීම් රු.1,320,930 ක් වුව ද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වටිනාකම රු.973,738 ක් ලෙස දැක්වීමෙන් ආදායම් නොවන ලැබීම් රු.347,192 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකරන බැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත හරස් සටහන් (11)වලින් ලැබෙන අගය එනම් රු.973,738 ක් පමණක් මූල්‍ය ප්‍රකාශයේ දක්වන ලදී. 2024 වසරේ සිට සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නිසා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ලැබීම් සටහන් කළ යුතු ය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී"ගිණුමෙහි හර ශේෂයේ උපරිම සීමාවෙහි තථ්‍ය අගය භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව රු.3,144,235 ක් වුව ද, එය රු.2,486,561 ක් ලෙස රු.657,674 ක් අඩුවෙන් ගිණුමෙහි පෙන්වා තිබුණි. | අදාළ නිරීක්ෂණයට එකග වන අතර, අතපසුවීමකින් හරස් සටහන් ද සැලකිල්ලට ගනිමින් සැසඳුම් ප්‍රකාශය පිළියෙලකර ඇති නිසා මෙම දෝෂය හට ගෙන ඇත. අදාළ නිරීක්ෂණයට අනුව කටයුතු කරන ලෙස විෂයභාර නිලධාරීට උපදෙස් දෙන ලදබව දන්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව හර ශේෂයේ උපරිම සීමාවෙහි තථ්‍ය අගය සටහන් කළ යුතු ය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව වාහන වටිනාකම රු.7,000,000 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාහන වටිනාකම රු.12,310,000 ක් වූයෙන් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් අගයට වඩා රු.5,310,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, එක් මෝටර් රථයක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණයේ වාහනවල වටිනාකම රු.7,000,000 ලෙස දක්වා තිබුණ ද, මෙම ආයතනයේ පැවති වාහන වෙනත් ආයතනවලට පවරාදීම් සහ අධිකරණ අමාත්‍යාංශය මගින් නව වාහන ලැබීම් සිදුව ඇති අතර, දැනට පවත්නා මෝටර් රථවලට අදාළව රක්ෂණයේදී වාර්ෂිකව ලබාදෙන තක්සේරු වටිනාකම්වලට අනුව මෙම අගය වැඩිවීම සිදු වී ඇත.WP KP 1092 මෝටර් රථය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට අදාළ විෂයභාර නිලධාරිනියව දැනුවත් කළ බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු ය. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වාහනවල අගය වෙනස්වීම් ලෙස රු. 1,900,000ක් අඩුකර දක්වා තිබුණ ද, සුදුසුකම්ලත් තක්සේරු ආයතනයකින් තක්සේරු කර නොතිබුණි. | මෙම තක්සේරු අගය නිර්ණය කරනු ලබන්නේ අදාළ මෝටර් රථවල නියෝජිතායතනය මගින් බව දන්වා තිබුණි. | සුදුසුකම්ලත් තක්සේරු ආයතනයකින් තක්සේරු කළ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කළ යුතු ය. |

**(ඈ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ගෙවීම් රු.1,281,895 ක් වුව ද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එම වටිනාකම රු.1,629,087 ක් ලෙස දැක්වීමෙන් රු.347,192 ක් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දී සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකළ බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත හරස් සටහන් (11) වලින් ලැබෙන අගය පමණක් මූල්‍ය ප්‍රකාශයේ දක්වන ලදී. 2024 වසරේ සිට සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නිසා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 52 අනුව අත්තිකාරම් ගෙවීම් සටහන් කළ යුතු ය. |

**(ඉ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද බැර කිරීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව රු.1,320,930 ක් වුව ද, එය රු.973,738 ක් ලෙස රු. 347,192 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට එකතුකර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දී සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකළ බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත හරස් සටහන් (11) වලින් ලැබෙන අගය පමණක් මූල්‍ය ප්‍රකාශයේ දක්වන ලදී. 2024 වසරේ සිට සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නිසා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව අත්තිකාරම් 'බී' ගිණුමට කළ යුතු බැරකිරීම් සටහන් කළ යුතු ය. |
| (ii) | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් 'බී' ගිණුමට කරන ලද හර කිරීම් භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව රු.146,512 ක් වුව ද, එය රු.493,704ක් ලෙස රු. 347,192 ක් අඩුවෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙන් අඩු කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දී සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නොකළ බැවින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත හරස් සටහන් (11) වලින් ලැබෙන අගය පමණක් මූල්‍ය ප්‍රකාශයේ දක්වන ලදී. 2024 වසරේ සිට සිගාස් වැඩසටහන ක්‍රියාත්මක නිසා ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත SA 51 අනුව අත්තිකාරම් 'බී' ගිණුමට කළ යුතු හර කිරීම් සටහන් කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 15 කට හා මූලධන වැය විෂයයන් 04 කට ප්‍රතිපාදිත රු.22,300,000 කින් රු. 5,770,791 ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 10 සිට සියයට 100 ක පරාසයක් දක්වා විහිදී තිබුණි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරි වී ඇත්තේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් පමණක් ප්‍රතිපාදන මුදා හැරීමත්, ඇතැම් අත්‍යාවශ්‍ය වියදම් දැරීමට අවශ්‍ය වුවත් ඒ සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලබා නොදීමත් හේතුවෙන් බව දන්වා තිබුණි. | නිසි සැලකිල්ලෙන් හා සකසුරුවම්භාවයෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |
| (ආ) | මුදල් රෙගුලාසි 66 යටතේ වැය විෂයය 1409 සඳහා රු. 600,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය | මෙම වැය විෂයය මඟින් ආරක්ෂක වියදම්, පවිත්‍රතා වියදම් හා වෙනත් වැය විෂයයකට යටත් නොවන සියලු | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව |

| | | |
|---|---|---|
| අවසානයට එසේ මාරු කරන ලද වටිනාකම සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයයේ ප්‍රතිපාදනවල මුළු ඉතිරිය රු.653,430 ක් වී තිබුණි. | වියදම් දරනු ලබන අතර, ප්‍රතිපාදනයන්හි යම් ඌනතාවයක් සිදුවිය හැකි යැයි පූර්වේක්ෂණය කළ බැවින්, රු.600,000 ක මුදලක් මාරු කර ගනු ලැබුව ද, එලෙස වියදම් උද්ගත නොවූයෙන් මෙම මුදල ඉතිරි වූ බව දන්වා තිබුණි. | ප්‍රතිපාදන මාරු කිරීම් කළ යුතු ය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) වගන්තිය ප්‍රකාරව පුද්ගලික පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ බැදීම් හඳුනාගත යුතු වුව ද, අතිකාල හා ගමන් දීමනා ලෙස රු. 17,899 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) හි බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක් පුරා අනුගමනය කළ පරිචය අනුව සෑම වසරකම දෙසැම්බර් මස අතිකාල හා ගමන් දීමනා ඉදිරි වසරේ ජනවාරි මස ගෙවීම් සිදු කරන බැවින් එය බැදීම් හා බැරකමක් ලෙස වාර්තා කරන ලද බව දන්වා තිබුණි. | අතිකාල හා ගමන් දීමනා බැරකම් ලෙස හඳුනා නොගත යුතු ය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ව්‍යවස්ථාපිත විධිවිධාන | | | | |
| | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 අතිවිශේෂ ගැසට් නිවේදනය | 771,817 | රු. 25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවද, අවස්ථා 10 කදී කරන ලද රු.771,817 ක ගෙවීම් වෙනුවෙන් මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | අදාළ විෂය භාර නිලධාරිනියව මේ සම්බන්ධයෙන් දැනුවත් කළ අතර, ඉදිරියේදී උක්ත ගෙවීම් සඳහා මුද්දර ගාස්තු නිසි පරිදි අය කරගැනීමට උපදෙස් ලබාදෙන ලද බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(ii)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** 371(2)(අ) | - | සුළු මුදල් අතුරු අග්‍රිමයෙන් එක් වරකදී එක් අවශ්‍යතාවයකට ගෙවිය හැකි උපරිම සීමාව රු.5,000 නොඉක්මවිය යුතු වුව ද, අවස්ථා 04 කදී රු. 5,000 ඉක්මවා වැය කර තිබුණි. | යොමුගත විධිවිධාන වලට අනුගතව එක් වරකදී එක් අවශ්‍යතාවයකට වියදම් කිරීමේ උපරිම සීමාව රු.5,000 පවත්වා ගැනීමට විෂයභාර නිලධාරීන් දැනුවත් කරන බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **(iii)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 4.3 වගන්තිය | 187,235 | අවස්ථා 02 කදී එකතුව රු.187,235ක වියදමක් දරා සිදුකරන ලද අලුත්වැඩියා වෙනුවෙන් ගෙවීම් කිරීමේදී චක්‍රලේඛය පරිදි සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. | මෝටර් රථ අලුත්වැඩියා සිදු කිරීමේදී විශ්වසනීයභාවය හා වඩා ගුණාත්මක සේවාවක් ලබා ගැනීමට පවත්නා ප්‍රතිපාදන යටතේ ඉදිරිපත් වී ඇති මිල ගණන් ඉතා ඉහළ අගයයන් නොවන විටදී හැකි සෑම අවස්ථාවකදීම නියෝජිතායතනය වෙත ද, රජයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ද යොමුකොට නිර්දේශ ලබාගෙන ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය | - | නිල වාහන සඳහා අනුයුක්ත කර ඇති සියලුම රියදුරන් ඇමුණුම 01 ලෙස හඳුන්වා දී ඇති ආකෘතිය පවත්වා ගෙන යා යුතු වුවත්, නිල වාහන දෙක සඳහා එක් මාසික දෛනික සටහනක් පමණක් පවත්වාගෙන ගොස් තිබුණු අතර, වගකිව යුතු නිලධාරියකුගේ සහතිකවීමක් | රියදුරන් විසින් සංචිත රථවල ධාවන සටහන් නිසි පරිදි පවත්වා ගෙන ගොස් ඇති අතර, අතිකාල දීමනා ඉල්ලුම් ආකෘති පත්‍රයේ අතපසුවීමෙන් ඇතැම් මාසවලදී ධාවනය කරන ලද කි.මී ගණන සඳහන් කොට නොමැත. ඉදිරියේදී එම සටහන් යොදන ලෙසට රියදුරන් දැනුවත් කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මාසික දෛනික සටහන් පවත්වාගෙන යා යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොමැතිව 2023 වර්ෂයේ දී කි.මී 3553ක් ධාවනය කර තිබුණි. | | |
| **(iv)** | **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ** | | | |
| | 2023 නොවැම්බර් 11 දිනැති අංක 03/2023 දරන චක්‍රලේඛය - | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම ඉදිරිපත් කිරීමේදී ආකෘති අංක 01,04 හා 3.11 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | යාවත්කාලීන කරන ලද රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ඉදිරියේදී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සකසන ලෙස අදාළ විෂයභාර නිලධාරිනියව දැනුවත් කළ බව දන්වා තිබුණි. | යොමුගත රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 වර්ෂය තුළ සිදුකරන ලද නීති ප්‍රතිසංස්කරණ කාර්යයන් තුනක් 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2023 වසර තුළ නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ සළකා බැලීමට අධිකරණ අමාත්‍යාංශය විසින් නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද්දේ 2023 මැයි 19 දින නව සභාපතිතුමා පත් කළ පසුව බැවින්, 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සකස් කළ 2023 ක්‍රියාකාරී සැලැස්මට එම ප්‍රතිසංස්කරණය ඇතුළත්කර නොතිබුණු බව දන්වා තිබුණි. | වර්ෂය තුළ කිරීමට නියමිත කාර්යයන් එම වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ යුතු ය. |

**3.2** **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 12 දිනැති අංක 06/2019 (i) රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචිව සිටින රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් ඔවුන්ගේ නියෝජිතයන්/ තැරැව්කරුවන් හරහා තරගකාරී මිල ගණන් කැඳවීම සිදුකර සාමාන්‍ය රක්ෂණාවරණ ලබා ගත හැකි වුව ද, එසේ මිල ගණන් කැඳවීමකින් | මෙම මෝටර්රථ 2018 වසරේ අධිකරණ අමාත්‍යාංශය මගින් ලබාදුන් අතර, එම වසරේ සිට මේ දක්වා රක්ෂණය කොට ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසිනි. එම සමාගම සතුටුදායක සේවාවක් ලබා දීම, රජයේ අනුබද්ධිත අර්ධ රාජ්‍ය සමාගමක් වීම සහ වඩා විශ්වසනීය හා වගකීම් සහගත වීම නිසා එම සමාගමෙන්ම සේවාව ලබාගත් අතර, | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| තොරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ 03 සඳහා රු.174,802 ක වියදමක් දරා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් රක්ෂණය කර තිබුණි. | වෙනත් සමාගම්වලින් මිල කැඳවීමක් සිදු නොකරන බව දන්වා තිබුණි. | |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව වාහනවල සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවන්ට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළයුතු බව දක්වා තිබුණද, ආයතනයේ වාහන 03 සඳහා උක්ත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර තිබුණු බවට වාහන පිළිබද ලොග් පොත් පරීක්ෂාවේදී තොරතුරු අනාවරණය නොවූ අතර, අවසන්වරට ඉන්ධන පරීක්ෂාව සිදුකර තිබුණේ 2018 වර්ෂයේ ය. | මෙම දෙපාර්තමේන්තුවේ ඉන්ධන සුළු අක්මුදල් ප්‍රමාණය රු.25,000 ක් වන අතර, සංචිත මෝටර් රථ 4 ක් පවතී. ඒ අනුව එදිනෙදා සංචිත රාජකාරි සඳහා ඉන්ධන නිකුත් කිරීමේදී ඉන්ධන සඳහා මුදල් ලබාගන්නේ ITMIS පද්ධතිය හරහා බැවින් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු පරිචයට අනුව කටයුතු කිරීමට දැනට පවතින අවස්ථාපිත කරුණු මත ප්‍රායෝගිකව දුෂ්කරතාවන් උද්ගත වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අයද, | අදාළ නිරීක්ෂණයේ සඳහන් නිලධාරීන් දෙදෙනා සඳහා ඇප තැබීමට අවශ්‍ය ලේඛන විධිමත් පරිදි දැනට වසර කීපයකට පෙර සිදු කරන ලද නමුත්, මේ වන විටත් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධ උපදෙස් ලැබී නොමැත. මෙම තත්ත්වය අධිකරණ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේදී ද නිරතුරුවම දැනුවත් කොට ඇත. මෙම නිලධාරීන් දෙදෙනා සඳහා නැවතත් ඇප | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකු ඇප තබා නොතිබුණි. | තැබීමේ ලේඛන යොමු කිරීමට සිදුවන බැවින් එකම කරුණ සඳහා රාජකාරීමය වේලාව කැප කිරීමට වීම කාලය අපතේ යැමක් බව දන්වා තිබුණි. | |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභා සාමාජිකයන් 18 දෙනාගෙන් සාමාජිකයන් 05 දෙනෙකු 2023 වර්ෂයේ කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. | නීති කොමිෂන් සභා රැස්වීම්වලට එක් වරක් හෝ සහභාගී නොවී ඇති සාමාජිකයින් පිළිබඳව නීති කොමිෂන් සභාවේ සභාපතිතුමා ද 2023 වසරේ පළමු නීති කොමිෂන් සභා රැස්වීමේදී ද සාකච්ඡාවට බඳුන් කරන ලදී. නීති කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කරනු ලබන්නේ ජනාධිපතිතුමා විසින් අවුරුදු 05 කාලයක් සඳහා ය. සභා පනතේ පවතින විධිවිධාන මත සහභාගී නොවීම හේතුවෙන් සාමාජිකත්වය අහෝසි වීමක් සිදු නොවන බැවින් ඔවුන් වෙනුවට නව සාමාජිකයින් පත් කිරීමට ද හැකියාවක් නොපවතින බව දන්වා තිබුණි. | රැස්වීම්වලට සහභාගී වීමට අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ආයතනයේ වෙබ් අඩවිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති අතර, දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේ අරමුණෙන් 2023/2024 වර්ෂය වෙනුවෙන් රු.28,350 ක වියදම් දරා Web hosting පහසුකම අලුත් කර තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය තාක්ෂණික දෝෂයක් නිසා ක්‍රියාවිරහිත වී ඇති අතර, එය නැවත ක්‍රියාත්මක කිරීම (revamping) සඳහා දත්ත පවත්වාගෙන යෑමට අදාළ රු. 28,350 ක මුදල දරන ලද අතර, දෝෂය යථාවත් කිරීමට 2023 අයවැයෙන් මුදල් ඉල්ලුම් නොලැබීම මත මෙම පහසුකම අලුත් කිරීමට සිදු විය. 2024 වසරේ අයවැයෙන් මුදල් ලැබීම මත අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | වෙබ් අඩවිය කඩිනමින් ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ බොහොමයක් වවුචර්පත් සඳහා ගෙවීම් ලබා ගන්නාගේ අත්සන යොදා නොතිබුණි. | අදාළ නිරීක්ෂණයට අනුව කටයුතු කරන ලෙස විෂයභාර නිළධාරීන් උපදෙස් දෙන ලද බව දන්වා තිබුණි. | වවුචර් සඳහා ගෙවීම් කිරීමේදී ගෙවීම්ලාභියාගේ අත්සන ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ද්විතීය මට්ටම තුළ අනුමත තනතුරු සංඛ්‍යාව 15 ක් වුව ද, තත්‍ය සේවක සංඛ්‍යාව 06 ක් වූයෙන් පුරප්පාඩු 09 ක් පැවතුණි. මේ තුළ ගිණුම් සහකාර තනතුර ද, සංවර්ධන නිලධාරි තනතුරු 01 ක්ද, කළමනාකරණ සහකාර තනතුරු 06 ක් ද, ලඝු ලේඛක තනතුරද, පුරප්පාඩු වී තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අදාළ ආයතනවලින් ඉල්ලීම් සිදු කළ ද, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම දැනට නිකුත් වී ඇති චක්‍රලේඛය ප්‍රකාරව නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය. |